සුනිල් මාධව
ප්‍රේමතිලක



71 අප්‍රේල් අරගලය ජීවිතයේ අමතක නොවන සිදුවීම් රැසක් එක් කළ කාලවකවානුවක්. ඒ දවස්වල මම සේවය කළේ ලේක්හවුස් ආයතනයේ. අප්‍රේල් කැරැල්ල සිදුවෙන කාලය තුළ මට ඔරියානා පලචි හඳුනාගන්න ලැබුණා.

ඇය ඔය කියන යුගයේ ලෝකෙ ජනප්‍රිය ම පුවත්පත් කලාවේදිනිය. ලෝකේ වැඩිම ආදායමක් ලබන පුවත්පත් කලාවේදිනිය ලෙසත් හඳුන්වන්න පුළුවන්. ඇය කොතැනකට ද යමක් ලියන්නේ, එය නැවත වෙනත් රටවල පවා උපුටා ගෙන පළ කරනු ලබනවා.

ඉතාලි ජාතික පුවත්පත් කලාවේදිනියක් වූ ඇය, මෙතරම් ජනප්‍රිය වීමට හේතු වුණේ අරගලයත් සමඟ සම්බන්ධ මාධ්‍යවේදිනියක් වීම.

මොරිස්මයිනර් ටැක්සිවල. මට ඉස්සරවෙලා ඔරියානාට තේරෙනවා ටැක්සිය කවුරුහරි ලුහුබඳින බව. දෙතුන් වරක් ම කවුරුහරි අපිව ලැහුබැන්දා. ඉතින් අපි ඒ වගේ අවස්ථාවල ටැක්සිය මාරු කළා. නැත්නම් ගමන නැවැත්තුවා. අපි ලුහුබැන්ද පිරිස පොලීසිය හෝ රහස් පොලීසිය විය හැකියි. මම විදේශිකයෙක් එක්ක යන එක ගැන ඒ අය උනන්දු වෙන්න ඇති. මොක ද ඔරියානා ගැන, ඔරියානා යනකම් කවුරුත් දැනගෙන හිටියෙ නැහැ. එහෙත් මා පිළිබඳ විශාල සැකයක් ඒ අවධියේ පොලීසියට තිබුණා.

ලංකාවේ බොහෝ ම දෙනෙක් ඒ කාලෙ ඔරියානා පලචි ගැන දන්නෙ නැහැ.

මාධ්‍යවේදියො කියන්නෙ කොච්චර සුන්දර වස්තුවක් ද කියලා මට හිතුණා. ඔරියානා පලචි මොන තරම් කැප කිරීමක් ද කරන්නේ. සත්‍ය සොයාගෙන සත්‍යය පස්සෙ ලුහු බඳිනවද? ඒ අතරම කොච්චර ලස්සනට වටහාගෙන තියෙනවද? මේ ජනතාව රජයකට විරුද්ධව නැගී සිටීමේ සාධාරණත්වය. රටවල්වල කුමන්ත්‍රණ කියන්නෙ ඊට වැඩිය වෙනස් දෙයක්.

ඔරියානා මාත් සමඟ පෞද්ගලිකව කතා කරන විට කියපු දෙයක් තිබුණා. 'මේ වගේ තමයි ලෝකෙ හැම තැනක ම බුද්ධිමත් තරුණ පරපුර තමයි නැගී සිටින්නෙ. ඒ අය රටේ ජන ගහනයෙන් සුළු කොටසක් වෙන්න පුළුවන්. ඒක තමයි රටක තියෙන බලසම්පන්නම දෙය. ඔවුන් මර්දනය කරනවා ලෝකෙ හැමතැනම. එහෙත් කවදා හෝ මහජනතාව තේරුම් ගනියි ඔහුන් හරි කියලා...'

ගොල්ලොත් බැලුවා ගහලා ගන්න බැරිවුණා. පස්සෙ පසු බැසලා කැස්ත්‍රෝලා වගේ ගරිල්ලා සටනක් කරනවා කියලා හිතන්න ඇති. මොකද එක විදිහක විප්ලව කරන්න බෑ රටවල් දෙකක. මොකද සමාජ පසුබිම, මිනිසුන්ගෙ සිතුම් පැතුම්, භූගෝලීය තත්වය, පරිසරය, සංස්කෘතිය ඔක්කොම බලන්න ඕන. හැබැයි එකක් තියෙනවා ලංකාවේ ඉතිහාසය වෙනස් කළ කැරැල්ලක් හැටියට එය හැඳින්විය යුතු වෙනවා. මම පිළිගන්න හැටියට ලංකාවේ සිදුවෙච්ච විශාලතම දේශපාලන ක්‍රියාවලිය 71 කැරැල්ලයි. මොකද එතැනින් මහා ජනතාවක් අවදි වුණා. ලොකු අවබෝධයක් ජනතාව ලැබුවා සන්නද්ධ අරගල කියලා දෙයක් ලෝකෙ තියෙනවා කියලා. ඒ අවබෝධය දීපු එකම වටිනවා. ඉතිහාසය විසින් කවදා හරි තීරණය කරයි විජේවීර, ජනතා විමුක්ති පෙරමුණ එදා කරපු දේ හරි ද වැරදි ද කියලා. අද වෙනතුරු ලංකා දේශපාලනයෙ වැදගත්ම දේ තමයි 71 කැරැල්ල.

ඕනම ධනවාදී රජයකට විරුද්ධව ලෝකයේ කොතනක ද ජනතාව නැගී සිටින්නෙ ඒ ජනතාව මර්දනය කරනවා. ඒ මර්දනය ජය ගන්නවා කියන එකට තමයි විප්ලව ජය ගන්නවා කියන්නේ. මං හිතනවා 71 ජ.වි.පෙ හිතන්න ඇති අපි පොලීසිවලට ගහලා පුළුවන් තරම් අල්ල ගමු. ඊට පස්සෙ පසුබැහැල පොඩ්ඩ පොඩ්ඩ යමු කියලා. ඒක අසාර්ථක වුණා. මොකද සමහර විට බෝම්බ 10ක් ගහද්දී එක බෝම්බයක්වත් පත්තු වුණේ නැහැ. ඒ වැඩේ අසාර්ථක වුණත් ඒ වගේ අරගලයක් 71 ඇති වුණේ නැත්තම් තාමත් නිදිමත ගතිය මේ රටේ තියෙනවා.

# 71 කැරැල්ලේ මගේ අත්දැකීම්

කොතන ද ජනතාවගේ නැගී සිටීමක් වෙන්නෙ, අරගලයක් එන්නෙ, ඔරියානා අනිවාර්‍යයෙන්ම එතන ඉන්නවා. ඒ හේතු නිසා ඇය ජනප්‍රිය වුණා. විශේෂයෙන්ම කැරලි හා සම්බන්ධව. වියට්නාම යුද්ධය වෙලාවේ එතන ප්‍රධාන චරිතයක් ලෙස ඇය හිටියා. කාම්බෝජයේ සටන්වල ප්‍රධාන චරිතයක්. ඒ නිසයි ඇයට වටිනාකමක් ආවේ.

කැස්ත්‍රෝල, චේලා විතරක් නොවෙයි සදාම් හුසේන්, එතකොට මැදපෙරදිග රජවරු හැමෝම වගේ පෞද්ගලික මිත්‍රයන් වගේ ඇසුරු කළා. මාධ්‍ය නිසා ඇයට එවැනි සම්බන්ධතාවක් ගොඩ නැගුණා. ඔය වගේ පසුබිමක් තියෙන ඔරියානා පලචි ලියපු මෑන් කියන කතාවේ පනාහෙලින් කියන ප්‍රධාන චරිතය අහනවා, මම මෙච්චර වද විඳිනකම් මට වෙද දෙනකම්, මට මරණ දඬුවම නියම කරනම් මගේ නඩු විභාග කාලේ උඹ කොහෙද හිටිය කියලා.

එතකොට ඔරියානා උත්තර දෙනවා ලාඕස්, කාම්බෝජ්, නොම්පෙන්, ට්‍රයිකන් අතරෙ කොළඹ කියලත් තියෙනවා. මගේ නම් ඇඟ හිරිවැටිලා ගියා කොළඹ කියලා තියෙන කොට. මොකද කොළඹ ඇවිත් මාව තමයි මුණ ගැසුණේ ඔරියානා.

රෙක්ෂි සිල්වා වීක් එන්ඩ් පත්තරේ ඒ කාලේ. ඔරියානා ගියාට පස්සෙ වීක් එන්ඩ් එකේ හෙඩ් ලයින් එකේ ගියා 'හයස්ට් ෆස්ට් ජනලිස්ට් ඉන් ද වර්ල්ඩ් කේම් ඇන්ඩ් ගෝන්' කියලා. ඔරියානා ඇවිත් යනකම් කිසිකෙනෙක් දන්නෙ නැහැ.

මට හැකි උපරිමයෙන් ඒ කාලෙ ඔරියානා සමඟ එක් වී මාධ්‍යයට සහ අපේ කැරැල්ලට සෑහෙන වැඩ කොටසක් කළා. ලෝකයේ මම පිළිගන්න ප්‍රධාන ම මාධ්‍යවේදිනිය ඇයයි. ඇය ලංකාවට එන්නේ 71 කැරැල්ල හේතු කරගෙනයි. ආණ්ඩුව මඟින් අප්‍රේල් 5දා කැරැල්ල මර්ධනය කිරීම ඇරඹීමත් සමඟ ඇය ලංකාවට පැමිණියා.

ඔරියානා පලචි මා මුණ ගැසීමට පැමිණියේ ඔබ්සවර් පුවත්පතේ සිටි ඒ වන විට කැනඩාවේ වාසය කළ කීර්ති අබේසේකරගේ මඟ පෙන්වීමෙන්. කීර්ති ලංකාවේ සිටි අවධියේ ගවේෂණාත්මක පුවත්පත් කලාව සම්බන්ධයෙන් උනන්දු වූවෙක්.

ඔරියානා ලංකාවට පැමිණ මා මුණ ගැසුණා. මම අපේ උදව්යට චන්ද්‍රගුප්ත වීරවර්ධන ද එක්කර ගත්තා. බොහෝ විට බොහෝ ස්ථාන වෙත චන්ද්‍රගුප්ත, මම ඔරියානා එක්ක ගියා. 71 කැරලි සමයේ, ඔරියානාට අවශ්‍ය වුණා යම් යම් අය මුණ ගැසෙන්න. ඇයට අවශ්‍ය වුණේ අරගලය මෙහෙය වූ අය මුණ ගැසීමට නොවෙයි. සාමාන්‍ය සටන්කාමීන් හමුවීමයි ඇයට අවශ්‍ය කළේ.

අපි ඉතාම රහසිගත විදිහට සටන් තිබුණු පැතිවලට ගියා. ඒ සටන්කාමීන් කීපදෙනෙකු හමුවුණා. ඒ අතර ඔරියානාට අවශ්‍ය කළා අරගලයට සම්බන්ධව සිරගත වූවන්ගේ කාන්තාවන් හමුවීමට. අපි ඒ අවස්ථාවත් ඇයට උදාකර දුන්නා. අරගලයට සම්බන්ධව සිරගත වූ ස්වාමිපුරුෂයන්ගේ භාර්යාවන් හා ඔරියානා මුණ ගැසුණේ රහසිගතව කොළඹ කොටුවෙ හෝටලයකදී. ඔරියානා ඒ කළ සම්මුඛ සාකච්ඡා හරි වැදගත් ඒවා.

71 කැරැල්ල පිළිබඳ ලෝකය ම දන්නවා. ඔරියානාට අවශ්‍ය කළා කැරලිකරුවන් කැරලිකාරියන් සමඟ සම්මුඛ සාකච්ඡා කරන්න. ඒ ගොල්ලන්ගෙ දේ බලන්න.

ඔරියානා සති තුනක් පමණ ලංකාවේ ගත කර යන්නට පෙර පැවසූ දෙයක් මට අද වගේ මතකයි 'මම ලෝකෙ හැමැතැනම කැරලිකාරයෝ එක්ක සම්මුඛ සාකච්ඡා කරලා තියෙනවා. ඒත් මට මේ වගේ බුද්ධිමත් පිරිසක් ලෝකෙ කිසි තැනක හමුවෙලා නෑ' කියලා.

ඒ කාලේ අපි තැනින් තැනට ගියේ පොඩි ෆොක්ස්වැගන්

වියට්නාම යුද්ධ අවස්ථාවේදීත් ඇය යුද බිමට ගියා. ඒ අවස්ථාවල කන ළඟින් වෙඩි උණ්ඩ ගිය හැටි ඇය 'මෑන්' පොතේ සටහන් කර තිබෙනවා.

අපේ 71 කැරැල්ල සම්බන්ධයෙන් ඇය ප්‍රකාශ කර සිටියේ එය ඉතාම සාධාරණ කැරැල්ලක් බව. අපේ අරගලය මෙහෙය වූ පිරිස හා බුද්ධිය සම්බන්ධයෙන් ඇය තුළ ඉතාමත් පැහැදීමක් තිබුණා.



අත්අඩංගුවට ගත් තරුණ පිරිසක් කඳවුරකදී

ආණ්ඩුවේ මර්ධනයට හැමදාම ඇය විරුද්ධයි. ඇය දන්නවා රටක ජනතාව නැගී සිටින්නෙ නිකං සෙල්ලමකට නෙමෙයි කියලා. පීඩාව තියෙන රටවල්වල තමයි ජනතාව නැගී සිටින්නෙ. විශේෂයෙන්ම තරුණ පරපුර. එය ඇය අත්දැකීමෙන් දන්නවා.

ඔරියානාගේ වටිනාකම තවදුරටත් වැඩි වෙන්නෙ මාධ්‍යවේදියා කියන්නෙ කවුද කියන එක ඇය දන්නවා. මාධ්‍යවේදියා කියන්නෙ රටක ආණ්ඩුවකට කඩේ යන කෙනෙක්වත් ආණ්ඩුව ජනතා නැගී සිටීමක් මර්ධනය කිරීම හමුවේ එය සාධාරණීකරණය කරන කෙනෙක්වත් නෙමෙයි. මේක මුළු ලෝකෙටම පොදුයි. කොතන ද අරගලය එතැන ඉන්න මාධ්‍යවේදිනියක් හැටියට ඔරියානා ප්‍රසිද්ධයි. එකෙන් තමයි ඇය ලෝකයේ ජනප්‍රියම මාධ්‍යවේදිනිය බවට පත්වුණේ.

ඇය ලංකාවෙන් ගිහිල්ලා කාලෙකට පස්සෙ ජේ.ආර් බලයට ආවා. ඒ වෙලාවේ ඇය මට ලියුමක් ලියලා අහනවා. පසුග ය වකවානුවට වැඩිය දරුණු වකවානුවක් දැන් තියෙනවා කියලයි පේන්නෙ. ඉතින් එදා කැරලි ගහපු තරුණ තරුණියො දැන් කෝ? අද ඔවුන් මොකද කරන්නෙ? කෝ ඒ දේ නැති වුණා ද? කියලා ඇය ප්‍රශ්න කළා.

හැත්තෑ එකේ මගේ පෞද්ගලික අත්දැකීම වචනවලට පෙරලන්න අපහසු තරම්. ජේ.වී.පී අප්‍රේල් පහ කැරැල්ල ඇරඹෙන්නට මාස ගානකට ඉස්සර වෙලයි සී.අයි.ඩී එක අපේ ගෙදරට ආවේ. ජේ.වී.පී එකෙන් එන පෝස්ටර් ගහන්න කලින් මම කොල්ලො ටිකක් එකතු කරගෙන පෝස්ටර් ගැහුවා ආණ්ඩුවේ ක්‍රියාදාමයට විරුද්ධව. ඒ වෙනකොට මම දන්නැහැ ජේ.වී.පී කියල එකක් තියෙනවා කියලා. අප්‍රේල් පහ ගහනවා කියලා මම දැනගෙන හිටියා. වැල්ලවායෙ පොලීසියට ගැහුවා කියපුවාම හිතට දැනුණෙ ලොකු ප්‍රබෝධයක්. මම හිතනවා ජ.වි.පෙ හැත්තෑ එකේ අනුග මනය කළේ කියුබාව කරපු දේ. කැස්ත්‍රෝ කරපු දේ කියලා. ගැහුවා ගන්න පුළුවන් කියන එක. ඒත් කැස්ත්‍රෝටත් බැරි වුණා ඒක. මේ

අපි පැහැදිළිව තේරුම් ගන්න ඕන වාමාංශික කියල මේ රටේ හිටපු කට්ටිය මොනව ද කළේ. අඩුම තරමින් නිර්ධන පන්තිය කියලා හෝ ධනපති පන්තිය කියලා දෙයක් රටේ තියෙනවා කියලවත් ජනතාවට ඔප්පු කරලා පෙන්නුවේ නැහැ. පාර්ලිමේන්තුවේ දී පට්ටගහලා බැනලා ලොකු හෝටල්වලට ගිහින් දෙගොල්ලො එකට එකතු වෙලා විස්කි ගහනවා.

එහෙත් සැබෑ නිර්ධන පන්තියක් ඉන්නවයි කියන එක පෙන්නුවේ ජනතා විමුක්ති පෙරමුණ හැත්තෑ එකේ.

ඉන්පසු 88-89 යුගයෙ රට තුළ පැවති තත්වය හා 71 සංසන්දනය කළහොත් අහසට පොළොව වගේ තත්වයක් පෙන්නුම් කළ හැකියි. මොකද එදා විජේවීර වුණත් ඇතුලෙ හිටියා. ගත්ත හැටියෙ මැරුවෙ නැහැ. 88-89 වුණේ මර්දනයක් නෙමෙයි මහා මිනිස් ඝාතනයක්. පොල්පොට්ලා, හිට්ලර්ලා කළා වගේ වැඩක්. ඒකට මර්දනය කියන්න බැහැ. ඒක සමූල ඝාතනයක්. ජවිපෙට සම්බන්ධ නැති කී දහස් ගාණක් කොල්ලන්ව කෙල්ලන්ව මැරුවද? ලස්සන කෙල්ලෙක් හිටියොත් හිටියොත් හමුදාව, පොලීසිය කෙල්ල උස්සගෙන ගිහින් දූෂණය කරලා මරන තත්වයක් ආවනේ. ඕකට ද දේශපාලන මර්දනය කියන්නේ.

ප්‍රේමදාස කරපු විදිහට ම සිරිමාටත් එදා කරන්න තිබුණා. නමුත් එහෙම කළේ නැහැ. හැත්තෑ එකේ හිරේ හිටපු කී දෙනෙක් අද ඇමතිවරු හැටියට ඉන්නවද?

හැත්තෑ එකේ සිදුවුණේ විප්ලවයක් කරන්න උත්සාහ කරපු කැරැල්ලක්. ඒ පිළිබඳව ලෝක ප්‍රජාවගේ අවධානය ලබා ගැනීමට ඔරියානා කළ සේවය ඉමහත්. අවසන් වශයෙන් මම එක ප්‍රාර්ථ නයක් කරන්න කැමතියි. ඔරියානා වගේ මාධ්‍යවේදිනියක් නැවත බිහිවෙයි කියල හිතන්න අමාරුයි. එහෙත් ඇයගෙ එක දශමයක ලක්ෂණ තියෙන මාධ්‍යවේදියො හෝ බිහි වෙනවනම් ඉතා වැදගත්. මේ වෙලාවෙ මට ඔරියානා එවපු ලිපියක් සම්බන්ධව මම දිනපොතේ ලියපු සටහනක් මතක් වෙනවා. එය මා සටහන් කළේ 1986 අගෝස්තු 4 දා.

ඔරියානා පලචිගෙන් හුඟාක් කාලයකට පස්සෙ අද ලියමනක් ලැබුණා. ඇය මගේ ජීවිතයට නව පණක් දුන්නා. ඔරියානා මුලින්ම හමු වූ දිනය මට මතක් වෙනවා. නවසිය හැත්තෑ එකේ අප්‍රේල් මාසයේ එක් දිනයක මට ඇගෙන් පණිවිඩයක් ලැබුණා.

එදා රජය කී අන්දමේ 'ත්‍රස්තවාදියකු' හමු වී සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට ඇය ආශාවෙන් සිටියා. මා ඕ සේතුං ලා, චේ ගුවේරාලා, කස්ත්‍රෝලා හමු වී ලෝකයට විප්ලවයේ සත්‍යය පැවසූ ඔරියානා පලචි... එදා මොන තරම් සුන්දර දවසක්ද? මම මගේ 'ත්‍රස්තවාදී මිතුරකු' සමඟ ඇය හමුවීමට ගියෙමි. ඇසූ ප්‍රශ්නය අද වගේ මතකයි.

'විප්ලවයක් කරන්නට හැදුවේ ඇයි...?'

'පීඩිත පන්තියට විමුක්තිය ලබා දීමට' පිළිතුරු දුන්නේ මොන තරම් ආඩම්බරයකින්ද?

'උඹේ රටේ සියයට අනූ නවයක්ම පීඩිත පන්තිය. ඒක අපි දන්නවා'

'උඹල මැරෙන්න බය නැද්ද?'

'අපෝ නැහැ. මැරෙන්න බය නැති නිසයි විප්ලව කරන්න ගියෙ. අපි මැරුණත් අපි කරන දේ හරිනම් ප්‍රශ්නයක් නැහැ'

එදා ඔරියානා පලචි චේගුවේරා ගැනත්, මාඕලා ගැනත් ලෙනින්ලා මාක්ස්ලා ගැනත් කතා කළ හැටි මට මතකයි.

'මේ රටේ තරම් බුද්ධිමත් තරුණ කොටස් මට ලෝකයේ කිසිම තැනක හම්බවෙලා නැහැ'

මගේ 'විප්ලවවාදී' මිත්‍රයා සිප ගනිමින් ඇය එසේ කී අයුරු මට මතකයි.